සේරුවිල ප්‍රාදේශීය සභාව
ත්‍රිකුණාමලදිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන
-------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මැයි 28දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 අගෝස්තු 27දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 27 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට සේරුවිල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනපිළියෙල කිරීමේ දී යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතුවේ. | මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

(ආ) ගිණුම්කරණ අඩුපාඩු
--------------------------

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබූ සංවර්ධන යෝජනා 05 කට අදාළව ලැබිය යුතු හා ගෙවිය යුතු රු.8,033,472 ක් ගිණුම්වලින්ද අතහැර තිබුණි. | නිවැරදි කළ යුතුවේ. | මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ii) | 2019 දෙසැම්බර් 31 වන දිනට ගෙවිය යුතු රු.65,734 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | නිවැරදි කළ යුතුවේ. | මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (iii) | සමුච්චිත අරමුදල් ගිණුමේ ආරම්භක ශේෂය රු.2,715,468 ක වැඩියෙන් සටහන් කර තිබුණි. | නිවැරදි කළ යුතුවේ. | මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | 2019 වර්ෂය තුළදී මිලදී ගන්නා ලද ස්ථාවර වත්කම් එකතුව රු.838,517 ක් ප්‍රාග්ධනයෙන් ආදායමට දායකවීමේ ගිණුමට බැර නොකර සමුච්චිත අරමුදලට බැර කර තිබුණි. | නිවැරදි කළ යුතුවේ. | නිවැරදි කිරීමට පියවර ගන්නා බව දන්වා සිටිමි. |
| (v) | මූල්‍ය ප්‍රකාශනවල වෙළඳ බලපත්‍ර ආදායම් හා උපලේඛන අතර රු.137,660 ක වෙනසක් විය. | අදාල නිවැරදිව කිරීම් කළ යුතුය. | වෙළඳ බලපත්‍ර සඳහා ආදායම් පරීක්ෂක හා මුදල් අයකැමි වෙන වෙනම මුදල් අයකොට ඇත. මුදල් අයකැමි විසින් අයකරන ලද වෙළඳ බලපත්‍ර ආදායම් ලේඛනයට ඇතුළත් නොවීම නිසා මෙම තත්ත්වය ඇති වී ඇත. මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

1.4 නීති,රීති,හා රෙගුලාසි වලට අනුකූල නොවීම්

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | (i) 24 වගන්තිය | මාර්ග ඉන්වෙන්ට්‍රිගත කර ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණි. | මාර්ග ඉන්වෙන්ට්‍රිගත කර ගැසට් කිරීමට කටයුතු කළ යුතුවේ. | මේ වන විට මාර්ග ඉන්වෙන්ට්‍රියක් සකස් කොට ඇති බවත් ඉදිරියේදී සියලු මාර්ග ගැසට් කිරීමට කටයුතු කරන බවත් දන්වා සිටිමි. |
| | (ii) 159 වගන්තිය | සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු රු.6,979,238ක හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| | (i) 59 වැනි රීතිය | සභාබල ප්‍රදේශයේ පවතින ව්‍යාපාර හා කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | ව්‍යාපාර පිළිබඳ සමීක්ෂණයක් සිදු කළ යුතුවේ. | 2020 වර්ෂයේ සිට ව්‍යාපාර හා කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කොට ඇති බව දන්වා සිටිමි. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) 217 වැනි රීතිය | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන පවත්වා ගත යුතුවේ. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| | (iii) 218වැනි රීතිය | සියලුම ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක් සමීක්ෂණය කර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක් සමීක්ෂණය කළ යුතුවේ. | සියලුම ඉඩම් හා ගොඩනැගිලි වසරකට වරක් සමීක්ෂණය කිරීමට කටයුතු යොදන බව දන්වා සිටිමි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>--------------------------------- | | | |
| | (i) මු. රෙ. 103 (i) (අ) හා 104(i) | 2018 වර්ෂයේදී වාහන අනතුරු දෙකකින් රු.142,930 ක හානියක් සිදු වී තිබූ නමුත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ කළ යුතුවේ. | මින් ඉදිරියට මුදල් රෙගුලාසි 103 (i) (අ) හා මුදල් රෙගුලාසි 104(i) ට අදාළ රෙගුලාසීන් අනුකූලව කටයුතු කරන බව දන්වා සිටිමි. |
| | (ii) මු. රෙ. 110 | අවස්ථා 02 කදී සිදු වූ රු.108,194 ක හානි සම්බන්ධයෙන් හානි ලේඛනයේ සටහන් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අදාළ හානි සම්බන්ධයෙන් හානි ලේඛයේ සටහන් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| | (iii) මු. රෙ.571 | වසර 2 ක් ඉක්මවූ රු.850,080 ක පොදු තැන්පතු ශේෂ 4 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අදාළ ප්‍රතිපාදන සභා අරමුදලට ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| | (iv) මු. රෙ.880 | ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප ලබාගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | සේවක ඇප තැන්පත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| | (v) මු. රෙ.1645 (ආ) සහ 1646 | වාහන 11 ක ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ඈ) | 2009 අප්‍රේල් 16 වන දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීමේදී ඇඟිලි සලකුණු යන්ත්‍රයේ වේලාවන් පදනම් කර ගත යුතු වුවද පැමිණීම පිටවීම ලේඛනයේ වේලාවන් පදනම් | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අංක 09/2009 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව කටයුතු ක්‍රියාත්මක කරන බව දන්වා සිටිමි. |

කරගෙන 2019 වර්ෂයේදී අතිකාල දීමනා ලෙස රු.145,787 ක් ගෙවා තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය
---------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වර්ෂය සඳහා සභාවේපුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,730,385 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූආදායමරු. 5,913,108 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
-------------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්
------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2019 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| කුලී | 3,815 | 4,166 | 3,842 | 324 | 5,423 | 3,469 | 3,975 | 1,547 |
| බලපත්‍ර ගාස්තු | 415 | 433 | 433 | - | 545 | 614 | 614 | - |
| වෙනත් ආදායම් | 7,183 | 11,967 | 5,788 | 4,910 | 12,823 | 7,198 | 10,948 | 5,431 |
| | 11,413 | 16,566 | 10,063 | 5,234 | 18,791 | 11,281 | 15,537 | 6,978 |

2.2.2 කඩකාමර කුලී
------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2011 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ලැබිය යුතු කඩ කුලී ආදායම රු.1,041,148 ක් විය. | හිඟ මුදල් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | නිතීමය මාර්ගයෙන් අදාළ හිඟ මුදල් අයකර ගැනීමට පියවර ගන්නා බව දන්වා සිටිමි. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු උසාවි දඩ රු.5,431,528 ක්වූ අතර ඉන් රු.1,681,459 ක් පූර්ව වර්ෂවලට අදාළ විය. | උසාවි දඩ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මූතූර් උසාවියෙන් ලැබිය යුතු දඩ මුදල් පිළිබඳ විස්තර ලබා ගෙන ඇති බවත් අදාළ මුදල් ප්‍රාදේශීය සභාව වෙත කොටස් වශයෙන් ලැබෙමින් පවතින බවත් දන්වා සිටිමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම සඳහා කටයුතු කළ යුතුවේ. | අතුරු ව්‍යවස්ථා පැනවීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වා සිටිමි. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | ඉදිරි වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඝන අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත්ව සිදුකර නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුවේ. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධව නිසි වැඩපිළිවෙලක් ඉදිරියේදී සකස් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි. |

(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ ඇතුළත් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා අදාළ නිර්ණායක සමාලෝචිත වර්ෂයේ දී හඳුනාගෙන නොතිබුණි. | තිරසාර සංවර්ධන පනත ප්‍රකාරව වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුවේ. | තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය වැඩසටහන් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශිය සභාව සතු ගොඩනැගිල්ලක් වෛද්‍ය මධ්‍යස්ථානයක් ලෙස පවත්වාගෙන යාම සඳහා මාසිකව රු.18,343 කට බදු දී තිබූ නමුත් එම ගොඩනැගිල්ල තක්සේරු දෙපාර්තමේන්තුව ලවා තක්සේරු කරවා ගෙන නොතිබුණි. | තක්සේරු වටිනාකමට කුළී අයකිරීමට කටයුතු කළ යුතුවේ. | තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පැමිණ පරීක්ෂා කොට මැන බලා ගිය බවත් ඉදිරි කාලය තුළ ඔවුන්ගෙන් ඒවාට අදාළ තක්සේරු වටිනාකම් ලබා ගත හැකි බවත් දන්වා සිටිමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ආර්යුර්වේද වෛද්‍ය තනතුර 2012 අගෝස්තු මස සිට පුරප්පාඩුව පැවතිනි. | ආර්යුර්වේද වෛද්‍ය නිලධාරියෙකු පත් කරවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ආයුර්වේද වෛද්‍යවරයෙකු ලබාදෙන ලෙස ඉල්ලීම් කොට ඇති බවත් ඉදිරියේදී ආයුර්වේද වෛද්‍යවරයෙකු ලබාගැනීමට කටයුතු කරන බවත් දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | තනතුරු 08 කට අදාළව පුරප්පාඩු 09 ක් විය. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදාළ පුරප්පාඩු ඉදිරියේදී සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි. |
| (ඇ) | තනතුරු 04 ක් සඳහා නිලධාරීන් 10 දෙනෙකුගේ අතිරික්තයක් විය. | අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා නොයන පරිදි සේවකයින් බඳවා ගැනීම සඳහා කටයුතු කළ යුතුවේ. | සභාවේ කාර්යයන් පුළුල් වීම හේතුවෙන් සහා අනුමැතිය හා පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය මත ආදේශක පදනමින් මෙම බඳවාගැනීම් සිදු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 නිශ්කාර්ය වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පිරිවැය රු.100,000 ක් වූ ට්‍රැක්ටර් ට්‍රේලරයක් වසර 03 ක සිට ක්‍රීඩාපිටියෙහි විනාශ වෙමින් පැවතිණි. | සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන බැහැර කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම ට්‍රේලරය නිසි පරිදි බැහැර කිරීමට කටයුතු යොදන බව දන්වා සිටිමි. |

3.4.2 පවරා නොගත් වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වනජීවි දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩම් 25 ක 2019 දෙසැම්බර් 31 වන විට රු. 68,008,546 ක් වැයකර ක්‍රීඩාංගන, පොදු ළිං, ප්‍රජා ශාලා, ජල ටැංකි, සුසානාගාර හා පොදු වෙළඳපලවල් ආදිය ඉදිකර තිබූ නමුත් මෙම ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය සභාවට පවරා ගෙන නොතිබුණි. | ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය ප්‍රාදේශීය සභාවට පවරා ගත යුතුවේ. | මෙම ඉඩම් නීත්‍යානුකූලව පවරා ගැනීමට අදාළ කටයුතු සිදු වෙමින් පවතින බව දන්වා සිටිමි. |
| (ආ) | වාහන 09 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහනවල අයිතිය නිසි පරිදි ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

3.4.3 ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | වාහන 05 ක් අවුරුදු 02 සිට 05 දක්වා කාලයක සිට අක්‍රිය තත්ත්වයේ පැවතිණි. | අළුත්වැඩියා කිරීමට හෝ බැහැර කිරීමට කටයුතු කළ යුතුවේ. | අක්‍රීය තත්ත්වයේ පවතින වාහන පිළිබඳ සහා අනුමැතියක් ලබා ගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

3.5 ප්‍රසම්පාදනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නිශ්චිත විස්තර හා වටිනාකම් දක්වා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතුවේ. | ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව දන්වා සිටිමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී තාක්ෂණික ඇගයීමකින් තොරව රු.184,990ක් වටිනා වායු සමීකරණ යන්ත්‍රයක් මිලට ගැනීම හා රු.281,301 ක් වූ අලිවැට ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. | තාක්ෂණ ඇගයීම් කමිටුවක් පත් කර ප්‍රසම්පාදන තාක්ෂණ ඇගයීම් කමිටුවේ ඇගයීමට ලක් කළ යුතුවේ. | මේ වන විට තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කොට ඇති බවත් ඉදිරියේදී තාක්ෂණික මට්ටමේ භාණ්ඩ හා සේවා සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ ලබා ගැනීමට කටයුතු කරන බවත් දන්වා සිටිමි. |

3.6 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රජාපාදක සංවිධාන සඳහා කොන්ත්‍රාත් පිරිනැමීමේදී මුළු වටිනාකම රු.මිලියන 2 ක් නොඉක්ම විය යුතු වුවද ග්‍රාම සංවර්ධන සමිතියක් වෙත රු.2,473,481ක් වටිනා කොන්ත්‍රාත් 03ක් පිරිනමා තිබුණි. | සීමාව නොඉක්මවන පරිදි කොන්ත්‍රාත් පිරිනැමීම සිදු කළ යුතුවේ. | මින් ඉදිරියට කොන්ත්‍රාත් පිරිනැමීමේදී රු.මිලියන 02 ක සීමාව ඉක්වමා නොයාමට වගබලා ගන්නා බව දන්වා සිටිමි. |
| (ආ) | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2012 ජනවාරි 05 දිනැති අංක 1/2012 දරන චක්‍රලේඛයේ 3.1 ප්‍රකාරව මූල්‍ය හැකියාව පරීක්ෂා කිරීමකින් තොරව රු.450 සිට රු.75,993ක් වූ බැංකු ශේෂ පැවති සමිති වෙත රු.7,177,296 ක කොන්ත්‍රාත් 15ක් පිරිනමා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව ඇගයීමක් සිදු කළ මූල්‍ය හා අනෙකුත් හැකියාවන් පරීක්ෂා කිරීමෙන් පසුව පමණක් කොන්ත්‍රාත් පිරිනැමිය යුතුවේ. | ප්‍රජා සංවර්ධන නිලධාරිගේ නිර්දේශය ප්‍රජා මණ්ඩලවලට කොන්ත්‍රාත් ලබාදීමේදී ලබා ගනු ලබයි. අළුතින් පිහිටවූ ප්‍රජා මණ්ඩල ශක්තිමත් කිරීම හා එම සමිති ඔස්සේ බල ප්‍රදේශවලට සේවාවක් සපයා |

| | | |
|---|---|---|
| | | ගැනීමේ අරමුණින් මූල්‍යමය හැකියාව අවම මට්ටමක පැවතියද එම සමිති වෙත කොන්ත්‍රාත් පිරිනමා ඇත. මේ වන විට මෙම සමිති ස්වකීය මූල්‍යමය හැකියාවන් වර්ධනය කරගෙන ඇති බවත් අදාළ ප්‍රජා මණ්ඩලය විසින් එම කොන්ත්‍රාත් වැඩ සාර්ථක ලෙස නිම කොට ඇති බවත් දන්වා සිටිමි. |
| (ඇ) හදිසි කාර්යයන් ලෙස සලකා සේරුවිල පූජා භූමියෙහි වූ රථගාල වටා අලිවැටක් ඉදිකිරීම සඳහා රු.281,301 ක් ගෙවා තිබුණද අලිවැට සඳහා යොදාගත් කණු ප්‍රමිතියකින් තොර වීම, අගල් 3 –4 අතර වට ප්‍රමාණයෙන් යුතුවීම හා යොදාගත් දැව කඳන් කළුතෙල්වල ගිල්වා නොතිබීම හේතුවෙන් දිරා ගොස් තිබුණි. එබැවින් අලිවැටෙහි පැවැත්ම සම්බන්ධයෙන් ගැටළු මතු වී තිබුණි. | වියදමෙහි ඵලදායීතාවය ඇති වන පරිදි කටයුතු කළ යුතුයවේ. | සේරුවිල පූජා භූමිය අවට ප්‍රදේශයේ වන අලි තර්ජනය ඉතා ප්‍රබල ලෙස මතුවූ බැවින් භූමියට එන බැතිමතුන්ගේ ජීවිතයට හානියක් වීමට පෙර අලිවැටක් ඉදිකිරීමට අත්‍යවශ්‍ය විය. නමුත් අඩු ආදායම් ලබන ප්‍රාදේශීය සභාවක් වශයෙන් ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම අපහසුය. මේ නිසා පදම් නොකළ දැව කණු යොදා අවම වියදමකින් අලිවැටක් ඉදිකරන ලදි. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
--------------------------------------------

4.1 විගණන හා කළමනාකරණ කමිටු
----------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතුවේ. | විගණන හා කළමනාකරණ කමිටු නිසි පරිදි පැවැත්වීමට කටයුතු යොදන බව දන්වා සිටිමි. |

4.2 නොවිසඳී ඇති විගණන නිරීක්ෂණ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නගර අලංකරණය සහ සභාවට ආදායමක් ලබා ගැනීමේ අරමුණින් දැන්වීම් ප්‍රචාරය සඳහා LED දැන්වීම් පුවරුවක් සවි කිරීම වෙනුවෙන් වර්ෂයේදී රු.938,000ක් වැය කර තිබුණි. මෙම දැන්වීම් පුවරුව ක්‍රියාත්මක කිරීමේ දී යෙදිය යුතු ආලෝක ප්‍රමාණය හා ප්‍රචාරය කල හැකි දැන්වීම් ප්‍රමාණය පිළිබඳ සැළකිල්ලක් නොදක්වා කටයුතු කිරීමෙන් 2014 මාර්තු 17 දින සිට අක්‍රීය වී තිබිණි. මේ හේතුවෙන් මේ සඳහා වැය කල මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | අඩුපාඩු නිවැරදි කර කඩිනමින් භාවිතයට ගත යුතුවේ. | මෙම LED දැන්වීම් පුවරුව අළුත්වැඩියා කිරීම සඳහා ලබාදී ඇති බවත් කොරෝනා වසංගතය හේතුවෙන් එහි කටයුතු ප්‍රමාද වූ බවත් ඉතා ඉක්මනින් මෙය ක්‍රියාකාරී මට්ටමට පත්කොට නැවත සවිකිරීමට හැකි වනු ඇති බවත් කාරුණිකව දන්වා සිටිමි. |